දිනමිණ The Dinamina e paper

100%

# නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා වගකීමක් රාජ්‍ය නිලධාරීන්ට පැවරෙනවා

## ● පැෆරල් සංවිධානයේ විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි

**මානෙල් පුෂ්ප කුමාරි**

නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා විශේෂ කාර්යභාරයක් හා වගකීමක් රාජ්‍ය අංශයේ නිලධාරීන්ට පැවරී ඇතැයි පැෆරල් සංවිධානයේ විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි මහතා පවසයි.

ස්වාධීන රාජ්‍ය සේවයක් සඳහා රාජ්‍ය වෘත්තීය සමිති සාමූහිකයේ පළමු මාධ්‍ය සාකච්ඡාව හෙක්ටර්කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ මධ්‍යස්ථානයේ දී ඊයේ(11) පැවැති අවස්ථාවේ දී ඒ මහතා මේ බව ප්‍රකාශ කළේ ය.

මෙම වගකීම සමාජයේ සෑම පුද්ගලයකුම සතු බවත් පවසන හෙතෙම ජනතා පරමාධිපත්‍ය බලය ස්වාධීන හා අපක්ෂපාතී ලෙස භාවිත කරමින් නිවැරදි මහජන නියෝජිතයන් පත් කිරීමටද බලය අවභාවිතයේ නොයොදවමින් ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් උදෙසා ස්වාධීන හා අපක්ෂපාතීව සිය මෙහෙවර ඉටු කිරීමට රාජ්‍ය නිලධාරියකු සතු යුතුකම හා වගකීම වන බවත් කියයි.

විවිධ දේශපාලන මැදිහත්වීම් හේතුවෙන් රාජ්‍ය නිලධාරීන්ට ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් සඳහා සිය දායකත්වය ස්වාධීන හා අපක්ෂපාතී ලෙස ලබාදීමට නොහැකි වේ. එසේ වුවත් රාජ්‍ය නිලධාරීන් ස්වාධීන සහ අපක්ෂපාතීව නීතියට අනුව ක්‍රියා කිරීමට කටයුතු කරන්නේ නම් දේශපාලනඥයන් හට ද තම අභිමතය පරිදි නීතිය නොසලකා ක්‍රියා කිරීමට නොහැකි වනු ඇත. නිදහස් හා සෑමට සාධාරණ මැතිවරණයක් පැවැත්වීමට මැතිවරණ කාලසීමාවේ දී රජයේ සේවයේ නියුතු නිලධාරීන් හුදෙක් අපක්ෂපාතී වීම පමණක් නොවන අතර ඒ බව ඔහුගේ හෝ ඇයගේ ක්‍රියාවන් වලින් පොදු මහජනතාවට මැනවින් ප්‍රදර්ශනය වීමක් හා ඒත්තු ගැන්වීමක් සිදුවිය යුතු බැවින් මැතිවරණයේ විනිවිදභාවය හා විශ්වසනීයත්වය මහජනයා තුළ ජනිත වන ආකාරයෙන් කටයුතු කිරීමේ වගකීම ගෞරවනීය රාජ්‍ය සේවකයා සතු වන බවද ඒ මහතා කියා සිටියි.



රාජ්‍ය සේවය ප්‍රමුඛ වෘත්තීය සමිති ලෙස අප සමස්ත රාජ්‍ය සේවකයන්ගෙන් ඉල්ලා සිටින්නේ ඔබගේ පෞද්ගලික දේශපාලන මතය කුමක් වුවද ඉදිරි මැතිවරණයේ දී මැතිවරණ නීතිය මැතිවරණ කොමසාරිස්වරයාගේ උපදෙස් හා උපමාන අනුව කටයුතු කරන ලෙස හා කිසිඳු දේශපාලනඥයකුට නීතිය අතට ගෙන ක්‍රියා කිරීමට හෝ රාජ්‍ය බලය හා සම්පත් අවභාවිතයට ඉඩ නොදෙන ලෙසද හෙතෙම සඳහන් කරයි.

ඉදිරි පාර්ලිමේන්තු මැතිවරණයෙන් කුමන දේශපාලන කණ්ඩායමක් බලයට පැමිණියද රටේත් ජනතාවගේත් යහපැවැත්ම පවත්වාගෙන යාමට නම් රාජ්‍ය නිලධාරීන් ස්වාධීනව කටයුතු කිරීම අතිශය තීරණාත්මක වේ. රාජ්‍ය සේවයේ ස්වාධීන වූ වෘත්තීය සමිති නායකයන් වන අප රාජ්‍ය නිලධාරීන්ගෙන් ඉල්ලා සිටින්නේ ඉදිරියේ දී රාජ්‍ය සේවයේ ගෞරවය සහ ස්වාධීනතාව ආරක්ෂා වන පරිදි කටයුතු කරන ලෙසයි. නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා තම කාලය ශ්‍රමය හා දැනුම වැය කරමින් නොබියව ස්වාධීනව හා අපක්ෂපාතීව කටයුතු කරන සමස්ත රාජ්‍ය සෙවකයන්ට තම රාජකාරිය ඉටු කිරීම නිසා සිදු වන ඕනෑම රාජකාරිමය අවහිරතාවකට හෝ ඔවුන් පත්වන අපහසුතාවන්ට සෘජුව මැදහත්වීමට හා අවශ්‍ය නීතිමය සහාය ද අතුළුව සියලු සහයෝගය ලබාදීමට කටයුතු කරන බව පැවසීය.

ශ්‍රී ලංකා කුම සම්පාදන සේවා සංගමයේ සභාපති ඩී.ඩී. මාතරආරච්චි, රජයේ ආයුර්වේද වෛද්‍ය සංගමයේ සභාපති වෛද්‍ය නිමල් කරුණාසිරි, සමස්ත ලංකා සමෘද්ධි කළමනාකරුවන්ගේ සංගමයේ සභාපති පී. රත්නුග්ගේ, මහජන සෞඛ්‍ය සේවා සංගමයේ සභාපති උපුල් රෝහණ මහත්වරු මෙහි දී අදහස් දැක් වූ අතර ස්වාධීන රාජ්‍ය සේවයක් සඳහා වන වෘත්තීය සමිති එකමුතුවේ නිලධාරීහු පිරිසක් මේ අවස්ථාවට එක් වූහ.

ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම © 2012 සියළුම හිමිකම් ඇවිරිණි.